# බැංකු සැසඳුම් ප්‍රකාශ

## AAT අදියර I

## FAC - මූල්‍ය ගිණුම්කරණය


සංදීප ජයසේකර

MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Visiting Lecturer – Colombo University



JMC Jayasekera Management Centre (Pvt) Ltd

Pioneers in Professional Education

65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

JMC vLearning
"your virtual learning partner"

# AAT 01 – මූල්‍ය ගිණුම්කරණය


## පරිච්ඡේදය - 05

## බැංකු සැසඳුම් ප්‍රකාශන

Sandeepa Jayasekera

MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, FCA, ACCA (UK), SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Visiting Lecturer – Colombo University

JMC vLearning "your virtual learning partner"



වර්තමානයේදි සෑම ස්ථාපිත ව්‍යාපාරයක්ම පාහේ සිය ගනුදෙනු වාණිජ බැංකුවක විවෘත කෙරෙන ජංගම ගිණුමක් තුලින් සිදු කිරීම සාමාන්‍යයෙන් සිදුවේ

2






JMC vLearning
"your virtual learning partner"

# ජංගම ගිණුමකින් කෙරෙන විවිධ ගනුදෙනු







| | | |
|---|---|---|
| ව්‍යාපාරයට ලද මුදල් සහ චෙක්පත් ජංගම ගිණුමේ තැන්පත් කිරීම | චෙක්පත් සහ ප්‍රේෂණ තුලින් විවිධ ගෙවීම් සිදු කිරීම | බැංකුව සපයන විවිධ සේවා සඳහා බැංකු ගාස්තු අය කිරීම |

5

# ජංගම ගිණුමකින් කෙරෙන විවිධ ගනුදෙනු







| | | |
|---|---|---|
| ණයගැතියන්ගෙන් සහ වෙනත් පාර්ශවයන්ගෙන් ලැබෙන් සෘජු ප්‍රේෂණ | සැපයුම්කරුවන්ට සහ වෙනත් පාර්ශව වෙත කෙරෙන සෘජු ගෙවීම් | ස්ථාවර නියෝග/නිත්‍ය නියෝග තුලින් කාලීනව කරන ගෙවීම් (කුලී, ණය වාරික) |

6

## ප්‍රශ්න අංක 01


ජංගම ගිණුමක් පවත්වාගෙන යෑම තුලින් ව්‍යාපාරයකට ලැබෙන වාසි මොනවාද?

JMC vLearning
"your virtual learning partner"

## ප්‍රශ්න අංක 02

බැංකුවක් මගින් ජංගම ගිණුම් හිමියන්ගෙන් අය කෙරෙන විවිධ ගාස්තු මොනවාද?




Sandeepa Jayasekera - JMC
10

JMC vLearning "your virtual learning partner"






JMC vLearning
"your virtual learning partner"

**විවිධ හේතු මත බැංකුව විසින් මුදල් ගෙවීම සඳහා චෙක්පතකින් ලද නියෝගයක් ප්‍රතික්ෂේප කළ හැකිය. එවන් චෙක්පත් අගරු චෙක්පත් ලෙස හඳුන්වයි.**

## චෙක්පතක් අගරු වීමට බලපාන හේතු






JMC vLearning
"your virtual learning partner"

## අගරු චෙක්පත්

- ලැබී තැන්පත් කළ චෙක්පතක් අගරු වූ විට
  - ණයගැතියෝ හෝ වෙනත් ලැබිය යුතු හර
    මුදල් පාලන ගිනුම බැර
- ගෙවීමක් සඳහා නිකුත් කළ චෙක්පතක් අගරු වූ විට
  - මුදල් පාලන ගිනුම හර
    ණයහිමියෝ හෝ වෙනත් ගෙවිය යුතු බැර

# බැංකු ප්‍රකාශනය



BANK OF CEYLON

Bankers to the Nation

**Contract statement 1542674039**


| | |
|---|---|
| Balance on 15.12.2019 | 20.00 $ |
| Income | 162.34 $ |
| Charges | -6.88 $ |
| Balance on 15.01.2020 | 421.32 $ |

JOHN CITIZEN
8 KOTTAGODA TALALLA SOUTH,
APT. 30
TALALLA, SRI LANKA
81170

Card operations № 403581** **** 2809 (Citizen J.) Charges:7.83

| Date and time of operation | Bank Processing Date | Transaction amount | Charged Amount | Description |
|---|---|---|---|---|
| 15.12.19 | 15.12.19 | 10.00 $ | 10.00 $ | Transaction Alert Fee |
| 18.12.19 | 18.12.19 | +130.25 $ | +130.25 $ | Replenishment to Paypal Ltd. London GBR |
| 20.12.19 | 20.12.19 | 209 $ | 209 $ | Payment for goods to Aliexpress |
| 23.12.19 | 23.12.19 | 91 $ | 91 $ | Credit card deposit 8426*********0387 |
| 26.12.19 | 26.12.19 | 2.21 $ | 2.21 $ | Credit card withdrawal 8426*********0387 |
| 29.12.19 | 29.12.19 | 18.37 $ | 18.37 $ | Replenishment to Skrill Ltd. London GBR |
| 07.01.20 | 07.01.20 | 77.90 $ | 77.90 $ | Payment for electricity |
| 15.01.20 | 15.01.20 | 246.32 $ | 246.32 $ | Payment for goods to Amazone online shop |

Sandeepa Jayasekera - JMC 15



| මුදල් පාලන ගිණුම | | බැංකුව පැත්තෙන් ජංගම ගිණුම |
|---|---|---|
| වත්කමකි | | වගකීමකි |
| වත්කම වැඩි වේ හර | මුදල් තැන්පතු | වගකීම වැඩි වේ බැර |
| වත්කම අඩු වේ බැර | චෙක්පත් සහ ප්‍රේශණ ගෙවීම් | වගකීම අඩු වේ හර |

- ජංගම ගිනුමේ තිබෙන මුදල්, ව්‍යාපාරය පැත්තෙන් වත්කමක් වේ. එමනිසා මුදල් තැන්පතු හර ලෙසත් මුදල් ගෙවීම් බැර ලෙසත් සටහන් කෙරේ.
- බැංකුව පැත්තෙන් ජංගම ගිනුමේ තිබෙන මුදල් වගකීමක් වේ. එයට හේතුව වන්නේ බැංකුව විසින් තමන්ගේ නොවන මුදලක්, ව්‍යාපාරය ඉල්ලන මොහොතක දිමට සුදානමින් තබා ගත යුතු වීමයි. එම නිසා ජංගම ගිනුමට මුදල් තැන්පතුවක් සිදු කළ විට බැංකුව පැත්තෙන් වගකීම වැඩිවන නිසා බැර ලෙසත් ජංගම ගිනුමෙන් ගෙවීමක් සිදු කළ විට වගකීම අඩු වන නිසා හර ලෙසත් සටහන් කෙරේ.
- එසේ නම් ව්‍යාපාරයට වත්කමක් සහ බැංකුවට වගකීමක් වන ජංගම ගිනුමේ ගනුදෙනු, ව්‍යාපාරයත් බැංකුවත් එකිනෙකට ප්‍රතිවිරුද්ධ ආකාරයට සටහන් කරයි



මතක තබා ගත යුතුයි

# බැංකු අයිරාවක් කියන්නේ මොකද්ද?

ජංගම ගිණුම් හිමියන්ට තමුන්ගේ ශේෂය ඉක්මවා ගෙවීම් සිදු කිරීමට කෙටි කාලීන ණයක් ලබා ගත හැකිය. මෙම කෙටි කාලීන ණය පහසුකම අයිරා පහසුකමක් ලෙස හැඳින්වේ. මෙය ජංගම ගිණුම් හිමියන්ට ලැබෙන් විශේෂ පහසුකමක් වේ.
කෙසේ නමුත් මෙම අයිරා ණය මුදල බැංකුව ඉල්ලා සිටින මොහොතක ගෙවීමට ව්‍යාපාරය බැඳී සිටී.

| ව්‍යාපාරයට අනුව බැංකු අයිරාව | | බැංකුවට අනුව බැංකු අයිරාව |
|---|---|---|
| වගකීමකි | | වත්කමකි |
| අයිරා වගකීම අඩු වේ හර | මුදල් තැන්පත් කළ විට | අයිරා වත්කම අඩු වේ බැර |
| අයිරා වගකීම වැඩි වේ බැර | චෙක්පත්/ප්‍රේෂණ ගෙවීම් කළ විට | අයිරා වත්කම වැඩි වේ හර |

JMC vLearning "your virtual learning partner"







IMC vLearn
your virtual learning partner

# වැරදි

- ගණකාධිකාරීගෙන් සහ බැංකුවෙන් සිදු වන වැරදි ලෙස වැරදි වර්ග 2ක් තිබේ.
- බැංකුවක තිබෙන පාලන ක්‍රම නිසා බැංකුවෙන් වරදක් වීමට තිබෙන ඉඩකඩ සාපේක්ෂව අඩුය. එහෙත් කලාතුරකින් බැංකුව විසින් වැරදි වටිනාකමක් බැංකුවට තැන්පත් කර හෝ අඩු කර තිබිය හැකිය
- ගණකාධිකාරී අතින් මුදල් පොතේ විවිධ වැරදි සිදු විය හැකිය. ගනුදෙනු අත්හැරී තිබීම, වැරදි වටිනාකම් සටහන්ව තිබීම උදාහරණ වේ
- මෙයින් බැංකුවේ වැරදි ව්‍යාපාරයට නිවැරදි කළ නොහැකි නමුත් ගණකාධිකාරී අතින් වූ වැරදි මුදල් පාලන ගිණුමේ නිවැරදි කළ යුතුවේ.


Oops!

# ගණකාධිකාරීවරයාට සිදුවන අත්හැරීම්

බැංකුව විසින් වාර්තා කළ පහත ගනුදෙනු ඇතැම් විට ගණකාධිකාරීවරයාට වාර්තා කිරීම අත්හැරී තිබිය හැකිය

| බැංකු ගාස්තු | ස්ථාවර නියෝග |
| --- | --- |
| චෙක්පොත් ගාස්තු, බැංකු ප්‍රකාශන ගාස්තු, සේවා ගාස්තු යනාදි ලෙස බැංකුව විසින් ඔවුන් සපයන විවිධ සේවා සඳහා ගාස්තු ජංගම ගිණුමෙන් සෘජුව අඩු කරයි.<br>මෙය ගණකාධිකාරීවරයාට අත්හැරී තිබිය හැකිය. බොහෝ විට ගණකාධිකාරීවරයා මෙම ගාස්තු පිළිබඳ දැනගන්නේම බැංකු ප්‍රකාශය තුලින් වේ. | ව්‍යාපාරයට සෑම මසකම ගෙවිය යුතු ස්ථාවර ගෙවීමක් ඇති විට එය සෘජුව ජංගම ගිණුමෙන් අඩු කර අදාළ පාර්ශවයට ගෙවන ලෙස බැංකුවට නිත්‍ය නියෝගයක් ලබා දිය හැකිය. බොහෝ විට කුළිය, ණය වාරික, රක්ෂණ ගාස්තු සඳහා නිත්‍ය නියෝග භාවිතා කරයි.<br>එය ගණකාධිකාරීවරයාට අත්හැරී තිබිය හැකිය. |

MC vLearning your virtual learning partner







JMC vLearning
your virtual learning partner

# කාල වෙනස්කම්

කාල වෙනස්කම් යනු බැංකු ක්‍රියාවලිය සහ ප්‍රායෝගික හේතු මත මුදල් පාලන ගිනුමේ ශේෂය සහ බැංකු ප්‍රකාශය අතර ඇතිවන තාවකාලික වෙනස්කම් වේ. කාල වෙනස්කම් කිසිවකු අතින් සිදු වූ වරදක් හෝ අත්හැරීමක් නොවේ. කාල වෙනස්කම් වර්ග 2කි

- තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්
- නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ ගෙවීම්

# තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්

- ජංගම ගිණුම තුල චෙක්පතක් තැන්පත් කළ විගස, ගණකාධිකාරීවරයා විසින් මුදල් පාලන ගිනුමට හර කරමින්, මුදල් පාලන ගිනුමේ ශේෂය වැඩි කරයි.
- චෙක්පතක් තැන්පත් කළ විට මුදල් පාලන ගිනුමේ ශේෂය වැඩි වුවද එසැණින්ම බැංකු ප්‍රකාශයේ ශේෂය වැඩි වන්නේ නැත. බැංකු ප්‍රකාශයේ ශේෂය වැඩි වීමට නම් චෙක්පත උපලබ්ධි විය යුතු වේ. චෙක්පතක් උපලබ්ධි වීමට යම් කාලයක් ගත වේ.

**උපලබ්ධි වීමේ ක්‍රියාවලිය කෙටියෙන් අවබෝධ කරගමු.**

- චෙක්පතක් යනු ජංගම ගිනුම් හිමියෙකු තම ගිණුමේ මුදල් තවත් පාර්ශවයකට ගෙවන ලෙස බැංකුවකට කරන විධානයකි. චෙක්පත ලබාගත් පාර්ශවය තම බැංකුවේ එම චෙක්පත තැන්පත් කළ විට, චෙක්පත නිකුත් කළ පාර්ශවයේ බැංකුවෙන් එම මුදල අඩු වී චෙක්පත තැන්පත් කළ බැංකුව වෙත මුදල් ගලා ආ යුතුය. එය උපලබ්ධි වීමක් ලෙස හඳුන්වයි.

JMC vLearn
your virtual learning partner

## තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්

- චෙක්පත නිකුත් කළ බැංකුව සහ තැන්පත් කළ බැංකුව යන දෙකම එකක් නම් එකම දිනයක් තුල උපලබ්ධි වීම සිදු විය හැකිය.
- නමුත් චෙක්පත නිකුත් කළ බැංකුව සහ තැන්පත් කළ බැංකුව, බැංකු දෙකක් නම්, මහ බැංකුව යටතේ එන ලංකා ක්ලියර් (Lanka Clear) ආයතනය තුලින් උපලබ්ධි කිරීම සිදුවන අතර, එයට දිනයක් දෙකක් ගත විය හැකිය.
- මාසයේ අග තැන්පත් කළ චෙක්පතක් මුදල් පොතට එකතු කළද (හර කළද) එය උපලබ්ධි වීමට දින කිහිපයක් ගත වීම නිසා එම මාසයේම බැංකු ප්‍රකාශනයට ඇතුලත් නොවී තිබිය හැකිය. එය උපලබ්ධි වීමෙන් පසු ඊළඟ මාසයේ බැංකු ප්‍රකාශය තුල එය තිබෙනු ඇත.
- උපලබ්ධි නොවූ තැන්පතු නිසා මුදල් පාලන ගිණුම සහ බැංකු ප්‍රකාශය අතර තාවකාලික වෙනසක් තිබිය හැකිය




JMC vLearning "your virtual learning partner"

## නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්

- ව්‍යාපාරය විසින් යම් ගෙවීමක් සඳහා චෙක්පතක් නිකුත් කළ විගස මුදල් පාලන ගිණුමේ ශේෂය අඩු කරමින් බැර සටහන යොදයි.
- එසේ වුවද බැංකුවේ ශේෂය ඒ මොහොතේම අඩු නොවිය හැකිය. එනම් චෙක්පත නිකුත් කළද තවමත් චෙක්පත ගෙවීම ලබන පාර්ශවයට නොලැබී තැපෑල තුල හෝ මාර්ගස්ථව තිබිය හැකිය. එමෙන්ම චෙක්පත ලැබී තිබුණද එය ඒ මොහොතේම බැංකුවට ඉදිරිපත් කිරීමක් නොකර තිබිය හැකිය. චෙක්පතක් මාස 6ක් යන තෙක් වලංගු බැවින් ඇතැමුන් චෙක්පත් කිහිපයක් එකතු කර බැංකුවට ඉදිරිපත් කරයි. එමෙන්ම බැංකුවට ඉදිරිපත් කර තිබුණද උපලබ්ධි වීමේ ක්‍රියාවලියට දින කිහිපයක් ගත වනු ඇත.
- ඉහත හේතු නිසා ගෙවීමකට නිකුත් කළ චෙක්පතක් මුදල් පාලන ගිනුමෙන් අඩු වුවද, එය බැංකුවට ඉදිරිපත් වීමේ ප්‍රමාදය නිසා මුදල් පාලන ගිනුමත් බැංකු ප්‍රකාශයත් අතර තාවකාලික වෙනස්කමක් ඇති වේ. එම වෙනස පසු කාලීනව චෙක්පත බැංකුවට ඉදිරිපත් වූ පසු නැතිව යනු ඇත



# බැංකු සැසදුම් ප්‍රකාශනය


## බැංකු සැසදුම් ප්‍රකාශනය

මුදල් පාලන ගිනුමේ ශේෂය සහ බැංකු ප්‍රකාශයේ ශේෂය අතර වෙනස්කම් පෙන්වීම සඳහා ගණකාධිකාරී විසින් පිළියෙල කරන ලේඛණය බැංකු සැසදුම් ප්‍රකාශයක් ලෙස හදුන්වයි




JMC vLearning
your virtual learning partner

# බැංකු සැසදුම පිළියෙල කරන ක්‍රියාවලිය




# බැංකු සැසදුම් ප්‍රකාශය පිළියෙල කරන පියවර

| | |
|---|---|
| 01 සන්සන්දනය කර වෙනස්කම් හදුනාගැනීම | පළමුව මුදල් පාලන ගිනුම සහ බැංකු ප්‍රකාශය එකිනෙක සන්සන්දනය කර වෙනස්කම් හදුනාගන |
| 02 සංශෝධිත මුදල් පාලන ගිනුම පිළියෙල කිරීම | ඉහත වෙනස්කම්වලින් අත්හැරීම් සහ ගණකාධිකාරී අතින් සිදු වූ වැරදි මුදල් පාලන ගිනුමට ගලපා සංශෝධිත මුදල් පාලන ගිනුම පිළියෙල කරනු ලැබේ |
| 03 බැංකු සැසදුම් ප්‍රකාශය පිළියෙල කිරීම | සංශෝධිත මුදල් පාලන ගිනුමේ සිට බැංකු ප්‍රකාශයේ ශේෂය දක්වා වෙනස්කම් (බැංකුව අතින් සිදු වූ වැරදි සහ කාල වෙනස්කම්) පෙන්වමින් බැංකු සැසදුම් ප්‍රකාශය පිළියෙල කරයි |

JMC vLearning "your virtual learning partner"

# මුදල් පාලන ගිණුමට කරන සංශෝධන (ගැලපිලි)



**බැංකු ගාස්තු**

බැංකු ගාස්තු හර
මුදල් බැර

**ණය සහ අයිරා පොළිය**

පොළී වියදම හර
මුදල් බැර

**සෘජු ප්‍රේෂණ**

ණයගැති ප්‍රේෂණ
මුදල් හර
ණයගැති බැර

ලාභාංශ
මුදල් හර
ලාභාංශ ආදායම බැර

JMC vLearning
"your virtual learning partner"

# මුදල් පාලන ගිණුමට කරන සංශෝධන (ගැලපිලි)



**ස්ථාවර නියෝග ගෙවීම්**

බැංකු ණය වාරිකය
බැංකු ණය හර (ප්‍රාග්ධන කොටස)
පොළී වියදම හර (පොළී කොටස)
මුදල් බැර

ගොඩනැගිලි කුළිය
ගොඩනැගිලි කුළී හර
මුදල් බැර

# සංශෝධිත මුදල් පාලන ගිණුමේ ආකෘතිය (අයිරාවක් නොමැති විට)

**මුදල් පාලන ගිණුම**

| | | | |
|---|---|---|---|
| ආරම්භක ශේෂය | XXX | බැංකු ගාස්තු | X |
| ණයගැති සෘජු ප්‍රේශණ | X | අයිරා පොළිය | X |
| ලාභාංශ ආදායම් | X | ණය වාරිකය - නිත්‍ය නියෝග | XX |
| අවතක්සේරු වීම නිවැරදි කිරීම | X | කුළිය - නිත්‍ය නියෝග | X |
| | | අධිතක්සේරු වීම නිවැරදි කිරීම | X |
| | | අවසාන ශේෂය | XX |
| | XXX | | XXX |
| ආරම්භක ශේෂය | XX | | |

# සංශෝධිත මුදල් පාලන ගිණුමේ ආකෘතිය (අයිරාවක් තිබෙන විට)

**මුදල් පාලන ගිණුම**

| | | | |
|---|---|---|---|
| ණයගැති සෘජු ප්‍රේශණ | X | ආරම්භක ශේෂය | XXX |
| ලාභාංශ ආදායම් | X | බැංකු ගාස්තු | X |
| අවතක්සේරු වීම නිවැරදි කිරීම | X | අයිරා පොළිය | X |
| | | ණය වාරිකය - නිත්‍ය නියෝග | XX |
| | | කුළිය - නිත්‍ය නියෝග | X |
| අවසාන ශේෂය | XX | අධිතක්සේරු වීම නිවැරදි කිරීම | X |
| | XXX | | XXX |
| | | ආරම්භක ශේෂය | XX |

JMC vLearning "your virtual learning partner"

## බැංකු සැසඳුම් ප්‍රකාශය තුල සාමාන්‍යයෙන් පහත අයිතම ඇතුලත් වේ




- **කාල වෙනස්කම්**
  - තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්
  - නිකුත් කළ මුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්
- **බැංකුව අතින් සිදු වූ වැරදි**

## බැංකු සැසඳුම් ප්‍රකාශ ආකෘතිය

| | | |
|---|---|---|
| **සංශෝධිත මුදල් පාලන ගිණුමේ ශේෂය** | | X/(X) |
| **එකතු කළා** | | |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් | X | |
| බැංකු ප්‍රකාශයේ ශේෂය වැඩිවන බැංකුව අතින් සිදු වූ වැරදි | X | XX |
| **අඩු කළා** | | |
| තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් | (X) | |
| බැංකු ප්‍රකාශයේ ශේෂය අඩුවන බැංකුව අතින් සිදු වූ වැරදි | (X) | (XX) |
| **බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය** | | XX |

**අයිරාවක් නම් සෘණ ලෙස දක්වන්න**

JMC vLearning
"your virtual learning partner"

# 2024 ජූලි ප්‍රශ්න අංක 1.19

**අස්තිත්වයක් බැංකු සැසදුම් ප්‍රකාශන පිළියෙල කරන්නේ ඇයි දැයි යන්නට හේතු දෙකක් (02) සඳහන් කරන්න**



JMC vLearning
"your virtual learning partner"

# බැංකු සැසදුම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ අරමුණු



ලැබීම් සහ ගෙවීම්වල නිවැරදිතාව පරීක්ෂා කිරීමට




බැංකු ප්‍රකාශයේ නිවැරදිතාවය පරීක්ෂා කිරීමට



චෙක්පත් උපලබ්ධි වීමේ ප්‍රමාදයන් හඳුනාගැනීමට

# බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ අරමුණු




බැංකුව මගින් සිදු වූ වැරදි හඳුනගැනීමට




නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් හඳුනාගැනීමට



අගරු වූ චෙක්පත් හඳුනාගැනීමට

# 2024 ජුලි ප්‍රශ්න අංක 5 (b)

2024 ජනවාරි 31 දිනට, **අනුෂ්කා බියුටි සැලෝන් හී** බැංකු ප්‍රකාශනයේ රු.27,000/- ක වාසිදායක ශේෂයක් පෙන් වූ අතර, මුදල් පාලන ගිණුම රු.25,000/- ක හර (වාසිදායක) ශේෂයක් පෙන්වීය. පසුව, ව්‍යාපාරයේ ගිණුම් විධායක විසින් බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් පාලන ගිණුමේ ශේෂය අතර, වෙනස සඳහා පහත සඳහන් හේතු සටහන් කරන ලදි

1. බැංකුවට ලබා දී ඇති ස්ථාවර නියෝගය අනුව, රු.15,000/- ක ණය වාරිකයක් බැංකුව විසින් හර කර තිබේ. නමුත්, මෙය මුදල් පොතේ සටහන් කර නොමැත
2. 2024 ජනවාරි 10 දින, බැංකුව විසින් බැංකු ගාස්තු ලෙස රු.500/- ක් හර කර තිබෙන අතර, එය මුදල් පොතේ සටහන් කර නොමැත
3. ස්ථාවර තැන්පතුවක් මත ලද රු.8,000/- ක පොලී ආදායම, බැංකුව විසින් බැංකු ගිණුමට බැර කර තිබූ නමුත් එය මුදල් පොතේ සටහන් කර නොමැත
4. 2024 ජනවාරි 30 දින නිකුත් කරන ලද රු.18,500/- ක චෙක්පතක් 2024 ජනවාරි 31 දින වන විටත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි
5. 2024 ජනවාරි 29 දින රු.9,000/-ක චෙක්පතක් බැංකුවේ තැන්පත් කරන ලද නමුත් එය 2024 ජනවාරි 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ පිළියෙළ කරන්න

1. ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත) (ලකුණු 03)
2. 2024 ජනවාරි 31 දිනට බැංකු සැසදුම් ප්‍රකාශනය. (ලකුණු 02)



## 2024 ජනවාරි ප්‍රශ්න අංක 1.17

2023 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනයේ රු.65,000/- ක වාසිදායක ශේෂයක් තිබූ අතර, එය එම දිනට මුදල් පොතේ ශේෂයට වඩා රු.5,000/- කින් අඩු විය. පහත සඳහන් ඒවා අතුරෙන්, වෙනස සඳහා වන හේතුව තෝරන්න

1. රු.2,500/- ක බැංකු ගාස්තු, මුදල් පොතේ වාර්තා කර නොතිබීම
2. නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් කර නොමැති චෙක්පත් වල වටිනාකම රු.5,000/- කි
3. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් වල වටිනාකම රු.5,000/- කි
4. ගනුදෙනුකරුවෙකු විසින් සිදු කළ රු.5,000/- ක ඍජු තැන්පතුව, මුදල් පොතේ වාර්තා කර නොතිබීම.



JMC vLearning "your virtual learning partner"

## 2024 ජනවාරි ප්‍රශ්න අංක 1.19

**පහත සඳහන් ඒවා අතුරෙන්, බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් පාලන ගිණුමේ ශේෂය අතර වෙනස සඳහා හේතුවක් විය හැකි කාල වෙනසක් වන්නේ කුමක් ද?**

1. ගනුදෙනුකරුවගෙ ලද සෘජු ප්‍රේෂණ
2. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්
3. බැංකුව විසින් හර කරනු ලැබූ බැංකු ගාස්තු
4. බැංකුව විසින් වැරදිමෙන් හර කළ අයිරා පොලිය



## 2024 ජනවාරි ප්‍රශ්න අංක 5 (b)

2023 දෙසැම්බර් 31 දිනට, **නිමල් හාඩ්වෙයාර් හි** බැංකු ප්‍රකාශනය අනුව රු.277,500/- ක වාසිදායක ශේෂයක් විය. එදිනට මුදල් පාලන ගිණුම ද රු.225,000/- ක හර (වාසිදායක) ශේෂයක් පෙන්වයි. බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් පාලන ගිණුමේ ශේෂය අතර වෙනස සඳහා පහත සඳහන් හේතු හඳුනාගන්නා ලදි

ස්ථාවර නියෝග උපදෙස් අනුව, මාසික කුළිය සඳහා රු.55,000/- ක් බැංකුව විසින් හර කර තිබූ අතර, එය මුදල් පොතේ සටහන් කර නොතිබුණි

1. 2023 දෙසැම්බර් 30 දින නිකුත් කළ රු.128,000/- ක චෙක්පතක්, 2023 දෙසැම්බර් 31 දින වනතුරු ගෙවීම් සඳහා ඉදිරිපත් කර නොතිබුණි
2. බැංකුව විසින් 2023 දෙසැම්බර් 15 දින හර කරන ලද රු.5,000/- ක බැංකු ගාස්තු, මුදල් පොතේ සටහන් කර නොතිබුණි
3. පසුගිය මාසයේදි වැඩිපුර අයකරන ලද රු. 12,500/-ක අයිරා පොලිය, 2023 දෙසැම්බර් 31 දින බැංකුව විසින් බැර කර තිබෙන අතර, එය මුදල් පොතේ සටහන් කර නොතිබුණි
4. රු.28,000/-ක චෙක්පතක්, බැංකු ගිණුමට තැන්පත් කළද, එය 2023 දෙසැම්බර් 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.



JMC vLearning "your virtual learning partner"

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ පිළියෙළ කරන්න

1. ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත) (ලකුණු 03)
2. 2023 දෙසැම්බර් 31 දිනට බැංකු සැසදුම් ප්‍රකාශනය (ලකුණු 02)

Sandeepa Jayasekera - JMC 49

## 2023 ජූලි ප්‍රශ්න අංක 1.13

පහත ප්‍රකාශය සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න

බැංකු සැසදුම් ප්‍රකාශය සකස් කිරීම වංචා සහ දෝෂ හදුනාගැනීමට සහ අවම කිරීමට උපකාරී වේ

Sandeepa Jayasekera - JMC 50

JMC vLearning "your virtual learning partner"

# 2023 ජූලි ප්‍රශ්න අංක 5 (b)

2023 මාර්තු 31 දිනට, **ඉෂාකර් ව්‍යාපාරයේ** හි බැංකු ප්‍රකාශනයේ රු.427,400/- ක වාසිදායක ශේෂයක් පෙන්වූ අතර, එදිනට එහි මුදල් පාලන ගිණුමේ රු.336,000/- ක වාසිදායක ශේෂයක් පෙන්වීය.
ව්‍යාපාරයේ සහකාර ගණකාධිකාරීවරයා විසින් බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් පොතේ ශේෂය අතර වෙනසට පහත සඳහන් හේතු හඳුනාගත්තා ලදි

1. බැංකුවෙන් ලබාගත් ණය මුදලට අදාලව, බැංකුව විසින් රු.25,000/-ක ණය වාරිකය අඩුකොට ඇති අතර, මෙය මුදල් පොතේ සටහන් කොට නොමැත
2. සෘජු බැංකු තහවුරුවක් නිකුත් කිරීම සඳහා බැංකුව අයකළ රු. 1,500/-ක බැංකු ගාස්තුව, මුදල් පොතේ සටහන් කොට නොමැත
3. පෙබරවාරි මාසය සඳහා වන රු. 12,100/- ක බැංකු අයිරා පොලිය, බැංකුව විසින් 2023 මාර්තු මාසයේදී අයකොට ඇති අතර, එය මුදල් පොතේ සටහන් කොට නොමැත



4. ස්ථාවර තැන්පතුව සඳහා වන රු.25,000/- ක ලැබූ පොලිය, බැංකු ප්‍රකාශනයේ බැර කොට ඇති නමුත්, මෙය මුදල් පොතේ සටහන් කර නොමැත
5. රු.120,000/-ක චෙක්පතක් බැංකුවට තැන්පත් කර ඇති නමුත් 2023 මාර්තු 31 දින වන විට එය උපලබ්ධි වී නොමැත
6. 2023 මාර්තු 30 දින නිකුත් කරන ලද රු.225,000/- ක චෙක්පතක්, 2023 මාර්තු 31 දින වන විටත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොමැත

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ පිළියෙළ කරන්න
1. ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත) (ලකුණු 03)
2. 2023 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය (ලකුණු 02)



JMC vLearning "your virtual learning partner"

## 2023 ජනවාරි ප්‍රශ්න අංක 1.5

**සැම් ට්‍රේඩර්ස්** හි 2022 මාර්තු 31 වන දිනට බැංකු ප්‍රකාශනයේ වාසිදායක ශේෂය රු.375,000/- ක් වූ අතර, මෙම ශේෂය මුදල් පොතේ ශේෂයට වඩා වෙනස් විය. 2022 මාර්තු 31 දිනට ඉදිරිපත් නොකළ චෙක්පත් හා උපලබ්ධි නොවූ චෙක්පත් පිළිවෙලින් රු.15,000/- ක් හා රු.24,000/- ක් විය

ඉහත සඳහන් තොරතුරු පදනම් කර ගනිමින්, 2022 මාර්තු 31 දිනට සැම ට්‍රේඩර්ස් හි පොත්වල පෙන්නුම් කළ මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) ශේෂය වූයේ:

1. 366,000/-
2. 336,000/-
3. 414,000/-
4. 384,000/-



## 2023 ජනවාරි ප්‍රශ්න අංක 4 (b)

2022 මාර්තු 31 දිනට, **නුවන් ට්‍රේඩර්ස්** හි බැංකු ප්‍රකාශනයේ රු.195,000/- ක වාසිදායක ශේෂයක් පෙන්වූ අතර, එදිනට එහි මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) රු.250,000/- ක හර ශේෂයක් පෙන්වීය. නුවන් ට්‍රේඩර්ස් හි ගණකාධිකාරීවරයා වෙනස සඳහා පහත සඳහන් හේතු හඳුනාගන්නා ලදි

1. ස්ථාවර නියෝග අනුව, බැංකුව විසින් රු.50,000/- ක රක්ෂණ වාරිකය හර කර තිබෙන නමුත් එය මුදල් පොතේ සටහන් කර නොමැත
2. රු.120,000/- ක චෙක්පතක් බැංකුවේ තැන්පත් කර ඇති නමුත් 2022 මාර්තු 31 දින වන විටත් එය උපලබ්ධි වී නොමැත
3. ගනුදෙනුකරුවෙකු විසින් බැංකු ගිණුමට රු.38,000/- ක සෘජු තැන්පතුවක් සිදු කළ අතර, එය මුදල් පොතේ වාර්තා කර නොමැත
4. 2022 මාර්තු මාසය සඳහා වන රු.500/- ක බැංකු ගාස්තු, මුදල් පොතේ සටහන් කර නොමැත



JMC vLearning "your virtual learning partner"

5. බැංකුව විසින් වැරදිමකින් රු.2,500/- ක් **නුවන් ට්‍රේඩර්ස්** හි බැංකු ගිණුමට බැර කර තිබේ
6. 2022 මාර්තු (29) දින **නුවන් ට්‍රේඩර්ස්** විසින් නිකුත් කරන ලද රු.75,000/- ක චෙක්පතක් 2022 මාර්තු 31 දින වන විටත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොමැත

පහත සඳහන් දෑ පිළියෙළ කරන්න
1. ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත) (ලකුණු 03)
2. 2022 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය (ලකුණු 02)



JMC vLearning "your virtual learning partner"

# 2022 ජූලි ප්‍රශ්න අංක 1.14

**සීමාසහිත** (XYZ) **සමාගමේ** 2022 මාර්තු 31 දිනට මුදල් පොතේ හර ශේෂය රු.225,000/- ක් වූ අතර, එදිනට ඇති බැංකු ප්‍රකාශනයේ ශේෂයෙන් එය වෙනස් විය. 2022 මාර්තු 31 දිනට ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් රු.36,000/- ක් වූ අතර, බැංකුව විසින් අයකරන ලද රු.5,000/- ක බැංකු ගාස්තු මුදල් පොතේ සැළකිල්ලට ගෙන නොතිබුණි

2022 මාර්තු 31 දිනට බැංකු ප්‍රකාශනයේ පෙන්නුම් කළ ශේෂය වූයේ
1. 256,000/-
2. 184,000/-
3. 194,000/-
4. 266,000/-

# 2022 ජූලි ප්‍රශ්න අංක 2 (b)

**කවිදු ස්ටෝර්ස්හි** බැංකු ප්‍රකාශනයේ 2022 මාර්තු 31 දිනට රු.390,000/- ක වාසිදායක ශේෂයක් පෙන්වූ අතර, මුදල් පාලන ගිණුමේ රු.560,000/- ක හර (වාසිදායක) ශේෂයක් පෙන්විය. වෙනස සඳහා හේතු වශයෙන් පහත සඳහන් කරුණු හේතු හඳුනාගත්තා ලදි

1. බැංකුවෙන් ලබාගත් ණයක් සඳහා රු.120,000/- ණය වාරිකයක් බැංකුව විසින් අයකරගෙන තිබූ අතර, එය මුදල් පොතේ වාර්තා කර නොමැත
2. බැංකුව විසින් පෙර මාසයේ දී වැඩියෙන් අය කළ බැංකු ගාස්තු නිවැරදි කිරීම සඳහා බැංකුව විසින් රු.5,000/- ක් ආපසු ලබා දී (බැර කර) තිබේ. මෙය මුදල් පොතේ වාර්තා කර නොමැත
3. බැංකුවේ තැන්පත් කරන ලද රු. 180,000/- ක චෙක්පතක් 2022 මාර්තු 31 දින වන විට උපලබ්ධි වී නොමැත
4. 2022 මාර්තු 30 දින කවිදු විසින් රු.125,000/- ක චෙක්පතක් නිකුත් කරන ලද අතර, එය 2022 මාර්තු 31 දින වන විටත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොමැත



ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ පිළියෙළ කරන්නග

1. ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත) (ලකුණු 03)
2. 2022 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය (ලකුණු 02)



JMC vLearning "your virtual learning partner"

## 2022 ජනවාරි ප්‍රශ්න අංක 1.10

**පහත ප්‍රකාශය සත්‍යද අසත්‍යද යන්න සඳහන් කරන්න**

**බැංකු සැසදුම් ප්‍රකාශය බැංකුව විසින් සකස් කරනු ලැබේ**

Sandeepa Jayasekera - JMC 59

## 2022 ජනවාරි ප්‍රශ්න අංක 3 (a)

2021 මාර්තු 31 දිනට **සීමාසහිත සීනා සමාගමේ** බැංකු ප්‍රකාශය අනුව වාසිදායක ශේෂය වූ රු.306,500/- එදිනට මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) හර ශේෂය (වාසිදායක) වූ රු.345,000/- සමඟ එකඟ නොවීය. වෙනස සඳහා හේතු පහත දැක්වේ

1. සමාගම විසින් 2021 මාර්තු 30 දින තැන්පත් කරන ලද රු. 75,000/- ක චෙක්පත, 2021 මාර්තු 31 දින වන විට උපලබ්ධි වී නොතිබුණි
2. 2021 මාර්තු 26 දින නිකුත් කරන ලද රු. 32,500/- ක චෙක්පත්, 2021 මාර්තු 31 දිනවන විට ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි.
3. 2021 මාර්තු 31 දින, පොළී ආදායමක් වශයෙන් රු.6,500/- ක් බැංකුට සෘජුවම ලැබී තිබුණි. මෙය මුදල් පොතේ වාර්තා කර නොතිබුණි
4. බැංකුව, 2021 මාර්තු මාසය සඳහා වන බැංකු ගාස්තු වශයෙන් රු.2,500/- ක් අඩුකර තිබූ අතර, එය මුදල් පොතේ වාර්තාකර නොතිබුණි

Sandeepa Jayasekera - JMC 60

JMC vLearning "your virtual learning partner"

ඔබ විසින් කළ යුතු දෑ:
පහත සඳහන් දෑ පිළියෙළ කරන්නග
1. ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත) (ලකුණු 03)
2. 2021 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය (ලකුණු 02)



JMC vLearning "your virtual learning partner"

# 2021 ජූලි ප්‍රශ්න අංක 1.3

පහත සඳහන් ඒවා අතුරෙන්, බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදි කාල වෙනස්කමක් (Time difference) සඳහා උදාහරණයක් ලෙස සළකනු ලබන්නේ කුමක්ද?

1. සෘජු තැන්පතුවක් වශයෙන් සරත්ගෙන් ලැබුණු රු.25,000/-, ගිණුම් පොත්වල වාර්තා කර නොමැත
2. රු.5,000/- ක චෙක්පොත් ගාස්තුව, ගිණුම් පොත්වල වාර්තා කර නොමැත
3. සැපයුම්කරුවෙකුට නිකුත් කළ රු.23,000/- ක චෙක්පතක් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොමැත
4. රු.3,500/-ක මුදලක්, බැංකුව විසින් වැරදිමකින් හර කර තිබීම.

# 2021 ජනවාරි ප්‍රශ්න අංක 1.16

**බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙල කිරීම සඳහා හේතු දෙකක් සඳහන් කරන්න.**



JMC vLearning "your virtual learning partner"

# 2021 ජනවාරි ප්‍රශ්න අංක 5 (b)

**සීමාසහිත** XYZ **සමාගමෙහි** 2021 ජනවාරි 31 දිනට බැංකු ප්‍රකාශයේ රු.243,000/- ක වාසිදායක ශේෂයක් පෙන්නුම් කරන ලද අතර, **සීමාසහිත** XYZ **සමාගමේ** මුදල් පාලන ගිණුමේ රු.175,000/- ක හර (වාසිදායක) ශේෂයක් පෙන්නුම් කරන ලදි. වෙනස සඳහා හේතු පහත සඳහන් පරිදි වේ.

1. බැංකුව, රු.5,000/- ක් බැංකු ගාස්තු වශයෙන් අඩුකරගෙන තිබෙන අතර, එය මුදල් පාලන ගිණුමේ සටහන් කර නොතිබුණි
2. ස්ථාවර තැන්පතුවක් මත පොළී ආදායම වශයෙන් රු.98,000/- ක පොලියක් බැංකුවට සෘජුවම ලැබී තිබේ. කෙසේ නමුත් මෙය මුදල් පොතේ සටහන් වී නොතිබුණි
3. **සීමාසහිත** XYZ **සමාගම** විසින් 2021 ජනවාරි (29) දින නිකුත් කරන ලද රු.125,000/- ක චෙක්පතක් 2021 ජනවාරි 31 දින වන විටත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි
4. බැංකුවෙහි තැන්පත් කරන ලද රු.150,000/- ක චෙක්පතක් 2021 ජනවාරි 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි

ඔබ විසින් කළ යුතු දෑ:
පහත සඳහන් දෑ පිළියෙල කරන්න

1. ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත ) (ලකුණු (02)
2. 2021 ජනවාරි 31 දිනට බැංකු සැසදුම් ප්‍රකාශය (ලකුණු (02)



JMC vLearning "your virtual learning partner"

## 2020 ජූලි ප්‍රශ්න අංක 5 (b)

**රණසිංහ සහ සමාගමේ** 2020 මාර්තු 31 දිනට, බැංකු ප්‍රකාශනය අනුව බැංකු ශේෂය, එහි මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) වාසිදායක (හර) ශේෂය වන රු.155,000/- සමඟ එකඟ නොවීය.
පහත සඳහන් හේතු පසුව හඳුනාගන්නා ලදි .
1. ස්ථාවර නියෝගයක් අනුව බැංකුව විසින් බැංකු ගිණුමෙන් රු.75,000/- ක මුදලක් අඩු කරගෙන තිබුණු ද එය මුදල් පොතෙහි වාර්තාකර නොතිබුණි
2. ගනුදෙනුකරුවෙකු විසින් බැංකුව වෙත සෘජුවම තැන්පත් කළ රු.30,000/- ක් මුදල් පොතෙහි වාර්තා කර නොතිබුණි
3. **රණසිංහ සහ සමාගම** විසින් 2020 මාර්තු (29) දින රු.195,000/- ක් වටිනා චෙක්පතක් නිකුත්කර තිබුණ ද, එය 2020 මාර්තු 31 දින වන විටත් ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණි
4. **රණසිංහ සහ සමාගම** විසින් 2020 මාර්තු 30 දින රු.65,000/- ක් වටිනා චෙක්පතක් බැංකුවෙහි තැන්පත් කර තිබූ නමුත් එය 2020 මාර්තු 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි
5. රු.1,500/-ක බැංකු ගාස්තු මුදල් පොතෙහි වාර්තාකර නොතිබුණි

ඔබ විසින් කළ යුතු දෑ:

1. ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත) පිළියෙල කරන්න (ලකුණු (03)
2. 2020 මාර්තු 31 දිනට බැංකු ප්‍රකාශනයෙහි පෙන්නුම්කරන ශේෂය හඳුනා දක්වන්න (ලකුණු (02)



JMC vLearning "your virtual learning partner"

## ප්‍රශ්න අංක 01

ව්‍යාපාරයක මුදල් පාලන ගිණුමේ ශේෂය රු. 15,000 ක අයිරාවක් වූ අතර, බැංකු ප්‍රකාශයේ ශේෂය ඊට වෙනස් විය ඒ සඳහා පහත හේතු හඳුනාගත හැකි විය

1. සෘජු ප්‍රේෂණ රු. 2,000 ක් සහ ස්ථාවර නියෝග ගෙවීම රු. 4,000 තවමත් මුදල් පාලන ගිණුමට වාර්තා කර නැත
2. බැංකුව වැරදි ලෙස රු. 5,000 ව්‍යාපාරික බැංකු ගිණුමට හර කර ඇත
3. ගණකාධිකාරී විසින් රු. 1,000 ක ගෙවීමක් දෙවරක් සටහන් කර ඇත
4. ඉදිරිපත් නොකළ චෙක්පත් රු. 10,000 කි
5. උපලබ්ධි නොවූ චෙක්පත් රු. 15,000 කි

ඔබ විසින් කළ යුතු දෑ:

1. ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත) පිළියෙල කරන්න (ලකුණු (03)
2. බැංකු ප්‍රකාශනයෙහි පෙන්නුම්කරන ශේෂය හඳුනා දක්වන්න (ලකුණු (02)




JMC vLearning
"your virtual learning partner"